00027

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**ESD1133/EPD3233 -** විෂයමාලා අධ්‍යයනය කුසලතා පිළිබඳ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

කාලය - පැය දෙකයි. (02)

| දිනය - 2023.07.16 | වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා |
|---|---|

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "පරිසරය" යන පදය නිර්වචනය කරන්න.

02. පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදිය හැකි ය. ඒවා ලැයිස්තුගත කරන්න. එක් එක් කොටසකට උදාහරණයක් බැගින් දෙන්න.

03. "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගෙනීමට සිසුන්ට ගුරුවරයා හැමවිට ම මඟපෙන්වීම කළ යුතු වේ."

    ඔබ මෙයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සඳහා හේතු තුනක් (03) සඳහන් කරන්න.

04. "සන්නිවේදනය" යන පදය පැහැදිලි කරන්න.

05. "සමෝධානිත ප්‍රවේශය" යන පදය කෙටියෙන් විස්තර කරන්න.

06. විධිමත් තක්සේරු කිරීම සහ අවිධිමත් තක්සේරු කිරීම අතර වෙනස පැහැදිලි කරන්න.

07. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි අධ්‍යාපනික තාක්ෂණික උපකරණ පහක් (05) සඳහන් කරන්න.

08. පරිසරය පිළිබඳ මහත්මා ගාන්ධිගේ දර්ශනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) ඓතිහාසික සංවර්ධනාත්මක හැරවුම් ලක්ෂ්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි වැදගත් අවධීන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(ii) ඔබ ඉහත සඳහන් කළ එක් හැරවුම් ලක්ෂ්‍යයක් තෝරාගෙන එම හැරවුම් ලක්ෂ්‍යය තෝරා ගැනීමට ඔබේ හේතු දක්වන්න. (ලකුණු 08)

10. (i) "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" විෂයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවේ ඇතුළත් අනෙකුත් විෂයයන්ගෙන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය වෙනස්වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

11. (i) පරිසරය පිළිබඳ දාර්ශනික අදහස් දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ඉහත සඳහන් කළ දාර්ශනික අදහස් වලින් එකක් තෝරාගෙන මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනයේ දී එම අදහස්වල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ඉගැන්වීමේ දී භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක දෙකක් **(02)** නම් කරන්න. (ලකුණු 02)

(ii) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ඉගැන්වීමේ දී එම ඉගැන්වීම් භාවිත කිරීමේ වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ඉහත දක්වා ඇති ඉගැන්වීම් ආධාරක භාවිත කිරීමේ දී ඇතිවිය හැකි ගැටළු දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) එම ගැටළු අවම කර ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

13. (i) විමර්ශනාත්මක ඉගෙනීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විමර්ශනාත්මක ක්‍රමය භාවිත කරමින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ඉගැන්වීමේ දී ක්‍රියාත්මක කළ හැකි ඉගෙනුම් අත්දැකීම් දෙකක් **(02)** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ අත්දැකීම්වල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.